# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2399/32 – 2024 අගෝස්තු මස 28 වැනි බදාදා – 2024.08.28**

**(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)**

# I වැනි කොටස: (I) වැනි ඡේදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: IR/COM/03/2018/83.

**කාර්මික ආරාවුල් පනත - 131 වන අධිකාරය**

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තිය යටතේ 2023.03.27 දිනැති හා අංක 2325/04 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2023.03.20 දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් පස්සර, පල්ලේගම, ජයසිරි පදිංචි ආර්.එම්. පියසේන මයා සහ කොළඹ 05, කිරුළ පාර, අංක 200 හි පිහිටි ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම්කිරීමෙන් සමථයකට පත්කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති අංක A/38/2023 හා 2024.03.20 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

**එච්. කේ. කේ. ඒ. ජයසුන්දර,**
**කම්කරු කොමසාරිස් ජනරාල්.**

2024 ජූලි මස 31 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.


*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

බේරුම්කරණ අංශය හා කාර්මික අධිකරණයේදීය

බේරුම්කරණ නඩු අංක : A/38/2023
IR/COM/03/2018/83

ආර්.එම්. පියසේන මයා,
ජයසිරි,
පල්ලේගම,
පස්සර.

*පළමු පාර්ශ්වය*

එදිරිව

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය,
අංක 200,
කිරුළ පාර,
කොළඹ 05.

*දෙවන පාර්ශ්වය*

වර්ෂ 2024 ක්වූ මාර්තු මස 20 වන දින දීය.

1.0. **හැඳින්වීම**

කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය මනූෂ නානායක්කාර මැතිතුමා විසින් 1957 අංක 14 සහ 1957 අංක 62 සහ 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ ශ්‍රී ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 සංශෝධන මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තිය අනුව ඉහත සඳහන් ආරාවුල බේරුම්කිරීම සඳහා බේරුම්කරුවකු වශයෙන් මා පත්කර ඇති බව IR/COM/03/2018/83 සහ 2023.03.20 දාතම දරන ලිපිය මගින් මා වෙත දන්වා එවා ඇත.

කම්කරු කොමසාරිස් ජනරාල්තුමාගේ 2023.03.13 වෙනි දින දරන ප්‍රකාශයේ සඳහන් වන ආකාරයට ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති කාර්මික ආරාවුලට හේතුවී පවත්තා කරුණු වනුයේ, “ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ සේවය කළ ආර්.එම්. පියසේන මහාතාට 2014.01.01 දින සිට 2015.05.12 දින දක්වා කාලය සඳහා කොන්ත්‍රාත් කාලය ද ඇතුලුව) හිඟ වැටුප් සඳහා හිමිකමක් තිබේ ද යන්නත්, එසේ හිමිකමක් තිබේ නම් ලැබිය යුතු සහනයන් කවරේද යන්නත් පිළිබඳව වේ.

ඒ අනුව එකී පාර්ශ්වකරුවන් අතර ඇති වී තිබෙන කාර්මික ආරාවුල විසඳීම සඳහා ගරු කම්කරු අමාත්‍යතුමා විසින් 2023.03.20 වන දින කරන ලද නියෝග පරිදි නිරවුල් කිරීම සඳහා බේරුම්කරුවකු වශයෙන් මා වෙත ඉදිරිපත් කර ඇත.

පළමුවන පාර්ශ්වකාර ඉල්ලුම්කරු විසින් 2015.10.29 දාතමින් කම්කරු කොමසාරිස්වරයාට ඉල්ලුම්පත්‍රයක් ගොනු කරමින් දන්වා ඇත්තේ, සේවා කාලය වයස අවුරුදු 60 දක්වා දීර්ඝ කිරීම සඳහා රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් අංක 01/2013 දරන චක්‍රලේඛයක් නිකුත් කර තිබියදී, එවකට ශ්‍රී ලංගමයේ මානව සම්පත් කළමනාකාරවරයා විසින් තම සේවා කාලය වයස අවුරුදු 60 දක්වා දීර්ඝ නොකර හිතාමතාම අවුරුදු 57න් අසාධාරණ ලෙස සේවයෙන් විශ්‍රාම ගන්වා ඇති බවත්, ඒ වන විට තමාගේ මෙන්ම, සේවා කාලය වයස අවුරුදු 60 දක්වා දීර්ඝ නොකොට, අවුරුදු 57න් විශ්‍රාම ගන්වන ලද සේවක මහත්ම මහත්මීන් විසින් ඒ පිළිබඳව කම්කරු විනිශ්චය සභාවට පැමිණිලි කිරීමෙන් පසු වයස අවුරුදු 60 දක්වා සේවය දීර්ඝ කිරීමටත් අදාළ සියළුම වරප්‍රසාද ලබා දීමටත් තීන්දුවක් ලබා දීම හේතු කොට ගෙන, ඔවුන්ට එම තීන්දුව පරිදි සේවා කාලය වස අවුරුදු 60 දක්වා දීර්ඝ

කර, අදාළ සියළුම වරප්‍රසාද ලබා දී ඇති බවත්, ඒ පිළිබඳව සළකා බලා තමාටද, ඒ ආකාරයෙන්ම සේවා කාලය වයස අවුරුදු 60 දක්වා දීර්ඝ කර අදාළ සියළුම වරප්‍රසාද ලබා දීමටත් තීන්දු දෙන ලෙසත්ය.

පළමුවන පාර්ශ්වකාර ඉල්ලුම්කරු විසින් 2023.04.24 දාතමින් කම්කරු කොමසාරිස්වරයාට ඉදිරිපත් කර ඇති ලිපියේ සඳහන් කර ඇත්තේ. තමා 1983.08.01 දින සිට ලංකා ගමනාගමන මණ්ඩලයේ සේවය කළ බවත්, 2013.12.31 දින සිට තමාගේ සේවය අසාධාරණ හා අයුක්ති සහගත ලෙස අවසන් කළ බවත්, 2014.01.01 දින සිට 2015.05.12 දින දක්වා කොන්ත්‍රාත් සේවය යෙදවූ බවත් වයස අවුරුදු 60 සම්පූර්ණ වන තුරු සේවය කිරීමට ඉඩ නොදුන් බවත් එබැවින් දීමනා හිඟ වැටුප් සමග ඒ වෙනුවෙන් ලැබිය යුතු අයිතිවාසිකම් සහ වන්දි මුදලක් ලබාදෙන ලෙස ඉල්ලා සිටින බවත්ය.

දෙවන පාර්ශ්වය වෙනුවෙන් 2023.05.26 දිනැති පළමු පිළිතුරු ගොනු කරමින් සඳහන් කර ඇති අනෙකුත් කරුණු අතර, ඉල්ලුම්කරුගේ උපන් දිනය 1956.08.04 දින වන බවත්, 1981.08.01. දින සිට දෙවන පාර්ශ්වයේ ආයතනයේ සේවය කොට, 2013.05.08 දිනට ඉල්ලුම්කරුට වයස අවුරුදු 57 ක් සම්පූර්ණ වීම හේතුකොට ගෙන එවකට ක්‍රියාත්මක වූ පිළිවෙත් ප්‍රකාරව එදින සිට ඉල්ලුම්කරුව සේවයේන් විශ්‍රාම ගන්වා ඇති බවත්, සඳහන් කර ඇති අතර, මෙම බේරුම්කරණය සම්බන්ධයෙන් දෙවන පාර්ශ්වය විසින් මූලික විරෝධතා ඉදිරිපත් කිරීමට බලාපොරොත්තුවන බවත් දන්වන ලදී.

අනතුරුව එම මූලික විරෝධතා ලිඛිත සැළකිරීමක් ලෙස 2023.05.26 දිනට පෙර ගොනු කිරීමට දෙවන පාර්ශ්වයට දන්වන ලද අතර එහි පිටපතක් ලබා ගෙන ඊට පිළිතුරු 2023.06.20 දිනට පෙර ගොනු කිරීමට පළමුවන පාර්ශ්වයට දන්වන ලදී. ඒ අනුව දෙපාර්ශ්වයම විසින් මූලික විරෝධතා හා ප්‍රතිවිරෝධතා බේරුම්කරු වෙත ගොනු කර තිබුණෙන් ඒ පිළිබඳ හබ කිරීම සඳහා 2023.08.10 දින නියම කරන ලදී.

එහෙත් 2023.08.10 දින පරීක්ෂණය නොපවත්වන ලද අතර ඒ වෙනුවට 2023.08.18 දින රැස් වූ අවස්ථාවේ හබ කරමින් ඉදිරිපත් කළ කරුණු සැළකිල්ලට ගනිමින්, ඒ පිළිබඳ තව දුරටත් කරුණු විමසීම සඳහා 2023.10.05. දින රැස්වීමට තීරණය කරන ලදී. එදින හබ කිරීමෙන් පසු 2023.10.30 දිනට ලිඛිත දේශන ගොනු කිරීමට තීරණය විය. ලිඛිත දේශනවලින් මූල්‍ය අගයන් සඳහන් කර නොතිබූ බැවින් ඒ පිළිබඳව කරුණු විමසීම සඳහා 2023.12.15 දින කැඳවන ලදී. ඉක්බිති තීරණය මෙසේ සඳහන් කරමි.

**2.0 පසුබිම**

ඉල්ලුම්කාර පළමුවන පාර්ශ්වකරු වන පස්සර, පල්ලේගම, ජයසිරි ලිපිනයෙහි පදිංචි ආර්.එම්. පියසේන මහතා 1983.08.01 දින XII වන ශ්‍රේණියේ ආරක්ෂක රැකවල්කරුවෙකු ලෙස දෙවන පාර්ශ්වකරු වන ශ්‍රී ලංකා ගමනගමන මණ්ඩලයේ සේවයට බැඳී පොත් තැබුම්කරුවකු (IX ශ්‍රේණිය) ජ්‍යෝෂ්ඨ පොත් තැබුම්කරුවකු (VI ශ්‍රේණිය) සහකාර මුදල් කළමනාකරුවකු (V ශ්‍රේණිය) ප්‍රධාන ගණකාධිකාරිවරයෙකු (III ශ්‍රේණිය) සහකාර මුදල් කළමනාකරුවකු වශයෙන් උසස්වීම් ලැබ පසුව අධ්‍යාපන සුදුසුකම් ලබා සේවයේ දක්ෂතා මත (වැඩ බලන) ප්‍රාදේශීය කළමනාකාර (මුදල්) වශයෙන් 2013.06.11 දින සිට පත්කරනු ලැබ ඇත.

(වැඩ බලන) ප්‍රාදේශීය කළමනාකාර (මුදල්) තනතුරේ සේවය කරමින් සිටියදී ඉල්ලුම්කාර පළමුවන පාර්ශ්වකාර ආර්.එම්. පියසේන මහතා වයස අවුරුදු 57 සම්පූර්ණවීම හේතු කොටගෙන 2013.08.04 දින සිට විශ්‍රාම ගන්වා ඇත. එසේ විශ්‍රාම ගැන්වීමට ප්‍රථම පළමුවන පාර්ශ්වකරු විසින් තමාට තවදුරටත් සේවය කළ හැකි බව දන්වමින් වසරකින් තම සේවා කාලය දීර්ඝකර දෙන ලෙස 2013.07.15 දාතමින් බදුල්ල ප්‍රධාන ප්‍රාදේශීය කළමනාකරු වෙත ඉල්ලීමක් කරමින් ලිපියක් යවා ඇති අතර, ප්‍රාදේශීය කළමනාකරු විසින් එම ඉල්ලීම ශ්‍රී ලංගම සභාපතිවරයාට 2013.07.16 දාතමින් ඉදිරිපත් කර ඇත.

කෙසේ වෙතත්, පළමුවන පාර්ශ්වකාර ඉල්ලුම්කරු විශ්‍රාම ගන්වන ලද 2013.08.04 දිනට පසු දින සිට අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතියට යටත්ව එවකට ඔහු දරමින් සිටි තනතුරේම කොන්ත්‍රාත් පදනම මත සේවය කිරීමට 2013.10.15 දාතමින් ප්‍රධාන මානව සම්පත් කළමනාකරු විසින් පත්කර ඇති නමුත්, එම පත්වීම අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත නොකරන ලද හෙයින් ඒ බව දන්වමින් 2013.12.23 දාතමින් පළමුවන පාර්ශ්වකරුට ලිපියක් යවා ඇත. ඒ අනුව ඔහු කොන්ත්‍රාත් පදනම මත 2013.08.05 දින සිට 2013.12.31 දින දක්වා සේවය කර ඇත.

ඒ අතරතුර, ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලයේ මානව සම්පත් කළමනාකර අංශය විසින් නිකුත් කරන ලද අංක 2013/3 චක්‍රලේඛය අනුව පළමුවන පාර්ශ්වකරු මෙන්ම, වයස වසර 57 සම්පූර්ණවීම මත සේවයෙන් විශ්‍රාම ගන්වන ලද වෙනත් සේවකයන්

විසින් ද ඒ පිළිබඳව අධිකරණමය ක්‍රියාවලියකට හා බේරුම්කරණ ක්‍රියාවලියකට යොමුවීම නිසා අධ්‍යක්ෂක මණ්ඩලය විසින් 2015.03.12 දින පැවැත්වූ රැස්වීමේදී ඉහත සඳහන් කළ පරිදි අංක 2013/3 චක්‍රලේඛය අනුව විශ්‍රාම ගන්වන ලද සියලුම නිලධාරීන් රාජ්‍ය ව්‍යවසාය චක්‍රලේඛ අංක 01/2013 දරන චක්‍රලේඛයේ විධිවිධාන පරිදි විශ්‍රාම ගැන්වීම සඳහා තීරණය කරන ලදුව, ඉල්ලුම්කාර පළමුවන පාර්ශ්වකරු ද සේවයේ නොයෙදී සිටි කාලය වැටුප් රහිතව තැබීමේ පදනම මත 2013.08.03 දින සිට සේවයේ පිහිටුවීමට තීරණය කර ඒ බව 2015.05.08 දිනැති ලිපිය මගින් පළමුවන පාර්ශ්වකරුට දන්වා යවා ඇත.

ඒ අනුව ඔහු සේවයට වාර්තා කර ඇති අතර, ඉක්බිති වයස අවුරුදු 60 පිරීම හේතු කොටගෙන, 2016.06.15 දාතම දරන ලිපිය මගින්, 2016.08.04 දින සිට යළි විශ්‍රාම ගන්වා ඇත.

ඒ අතරතුර, ආර්.එම්. පියසේන මහතා විසින් බදුල්ල කම්කරු කොමසාරිස් වෙත 2015.10.29 දිනැතිව ලිපියක් යවමින් දන්වා ඇත්තේ, තම සේවා කාලය වයස අවුරුදු 60 දක්වා දීර්ඝ කිරීමට හැකියාව තිබියදී, ලංකා ගමනාගමන මණ්ඩලය හිතාමතාම, තමා වයස අවුරුදු 57 සම්පූර්ණ වීමත් සමගම අසාධාරණ ලෙස සේවයෙන් විශ්‍රාම ගන්වා ඇති බවත්, (පැ.07) එම වකවානුව තුළ තමා සමග සේවය කළ තමා හා සම වයසේ සිටි සේවක සේවිකාවන් කිහිප දෙනෙක් ද ඒ අකාරයෙන්ම වයස අවුරුදු 57 සම්පූර්ණ වීමත් සමගම විශ්‍රාම ගන්වා, පසුව ඒ සම්බන්ධයෙන් කම්කරු විනිශ්චය සභාව වෙත ඉදිරිපත් කරන ලද අභියාචනයන් අනුව ඔවුන් සියළුම දෙනාම යළි සේවයේ පිහිටුවා ඔවුන්ට හිමි සම්පූර්ණ වැටුප් ඇතුළු සියළුම වරප්‍රසාද ලබා දී ඇති බවත් නමුත් තමාට පමණක් ඒ ආකාරයෙන් කටයුතු නොකළ බවත්, එහෙයින් තමාටත් සෙසු සේවකයන් සම්බන්ධයෙන් ක්‍රියා කළ ආකාරයෙන් කටයුතු කර, තමාට ලැබිය යුතු හිඟ වැටුප් ලබා දෙන ලෙසත්ය.

ඉන් අනතුරුව, ඉල්ලුම්කාර පළමුවන පාර්ශ්වකරු වන ආර්.එම්. පියසේන මහතා යළිත් වරක් 2023.04.24 දිනැතිව කම්කරු කොමසාරිස් ජනරාල් වෙත පළමු ප්‍රකාශය ලෙස සඳහන් ලිපියක් ඉදිරිපත් කරමින්, ඉහත 2015.10.29 දිනැති ලිපියෙහි සඳහන් කර ඇති කරුණු යලිත් සඳහන් කර ඇති අතර ඊට අමතරව, තමා 2013.08.05 දින සිට 2013.12.31 දින දක්වා කොන්ත්‍රාත් සේවයේ යොදවා ඇති බැවින්, එම කාලයද ඇතුළත්ව වැටුප් ගණනය කර, තමා විසින් ඉදිරිපත් කර ඇති කරුණු සැලකිල්ලට ගෙන, තමාට සාධාරණයක් ඉටු කර දෙන ලෙසද, ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ පරිපාලනය විසින් තමාට වෙත අවුරුදු 60 සම්පූර්ණ වන තුරු සේවය කිරීමට ඉඩ නොදීම හේතුවෙන් ලැබිය යුතු අයිතිවාසිකම් සමග වන්දි මුදලක් ලබාදෙන ලෙසද, ඉල්ලා ඇත.

3.0. අනාවරණය වූ කරුණු

පළමු පාර්ශ්වකරුගේ ඉහත සඳහන් ඉල්ලීම සම්බන්ධයෙන් 2023.05.26 දිනැතිව ප්‍රකාශයක් ඉදිරිපත් කරමින්, දෙවන පාර්ශ්වකරු වන ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය සඳහන් කර ඇත්තේ පළමුවන පාර්ශවකරුගේ උපන් දිනය 1956.08.04 දින වන බවත්, රැකවල්කරුවෙකු ලෙස 1983.08.01 දින සිට ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලයේ බදුල්ල ඩිපෝවේ ආරක්ෂක රැකවල්කරුවෙකු (අනියම් XIII) ලෙස සේවයට බැඳී, සිය සේවා කාලය තුළ පොත් තැබුම්කරුවකු, ගිණුම් සහකාරවරයෙකු, කළමනාකාරවරයෙකු (මුදල්), ජ්‍යෙෂ්ඨ ගිණුම් ලිපිකරුවෙකු, ප්‍රධාන ගණකාධිකාරිවරයෙකු, සහකාර කළමනාකාරවරයෙකු (මුදල්) ආදී තනතුරු හොබවා වයස අවුරුදු 57 සම්පූර්ණ වීම හේතු කොටගෙන, 2013.08.03 දින විශ්‍රාම ගන්වා ඇති බවත්, ඉක්බිති අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතියට යටත්ව කොන්ත්‍රාත් පදනම මත සේවයේ යොදවා ඇති බවත්, එසේ වුවද, එම කොන්ත්‍රාත් පදනම මත සේවයේ යෙදවීම, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ප්‍රතික්ෂේප කිරීම හේතු කොටගෙන 2013.12.23 දින සිට සේවය නතර කර ඇති බවත්, 2015 අංක 01 දරන මානව සම්පත් කළමනාකාර චක්‍රලේඛය අනුව වයස අවුරුදු 57 ඉක්මවූ සේවකයන් යළි සේවයට බඳවා ගැනීම මත, පළමු පාර්ශ්වකරු ද, හිඟ වැටුප් රහිතව නැවත සේවයේ පිහිටු වූ බවත්, එහෙයින් හිඟ වැටුප් ඉල්ලා සිටීමේ අයිතියක් පළමු පාර්ශ්වයට නොමැති බවත්ය.

2023.06.26 දිනැතිව ප්‍රකාශයක් ඉදිරිපත් කරමින් පළමු පාර්ශ්වකරු ප්‍රකාශ කරන්නේ, මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ අංක PED/ හා 2013.10.05 දිනැති අංක 1/2023 රාජ්‍ය ව්‍යවසාය චක්‍රලේඛය පරිදි රාජ්‍ය ව්‍යවසායවල සේවකයින් විශ්‍රාම ගැන්වීමේ වයස අවුරුදු 60 දක්වා දීර්ඝකර ඇති බැවින්, හා කිසියම් සේවකයකු වයස අවුරුදු 55 ඉක්මවා සේවයේ යෙදීමට අපේක්ෂා කරන්නේ නම්, ඒ අයට වයස අවුරුදු 60 දක්වා සේවය කිරීමට අවස්ථාව ලබාදිය යුතු බව සඳහන් වන බවත් එසේ වුවද තමා 2013.08.04 දින විශ්‍රාම ගැන්වූ නමුත්, 2023.08.05 දින සිට ප්‍රාදේශීය මුදල් කළමනාකරුවෙකු ලෙස සේවයේ යොදවා ගෙන සිටි බවත්, ඉක්බිති 2014.01.01. දින සිට සේවයෙන් මුදවා හැරි බවත්, තමාට 2013.08.04 දින සිට 2015.05.12 දින දක්වා කාලයට වැටුප්

හිමිවිය යුතු බවත්, ඊට අමතරව වයස අවුරුදු 60 සම්පූර්ණ වන දිනය දක්වා වූ කාලය සඳහා ස්ථිර සේවකයකුට හිමි සියලු දීමනා සහිතව වැටුපක් ලැබිය යුතු බවත්, ඒ අනුව 2013.08.04 දින සිට 2015.05.12 දින දක්වා හිඟ වැටුප් සහ, එම කාලය තුළ ලැබිය යුතු අනෙකුත් අයිතිවාසිකම් හා ශ්‍රී ලංකා ගමනා ගමන සේවකයින්ට ලබාදෙන ප්‍රසාද දීමනා ද ලබාදෙන ලෙසත් ය.

**4.0. ඒ අනුව මූලික විරෝධතාව පිළිබඳව විමසීම**

**4.1 මූලික විරෝධතාව**

දෙවන පාර්ශ්වකරු වෙනුවෙන් පිළිතුරු ගොනු කරමින් නීතිඥ දිමුතු පනංගල මහත්මිය සඳහන් කර ඇති අනෙකුත් කරුණු අතර, 2013.05.03. දිනට ඉල්ලුම්කරුට වයස අවුරුදු 57 සම්පූර්ණ වීම මත මාණ්ඩලිය පිළිවෙත් ප්‍රකාරව එදින සිට ඉල්ලුම්කරුව සේවයෙන් විශ්‍රාම ගන්වා ඇති බවත්, පහත සඳහන් පරිදි කරුණු මත මෙම නඩුව පවරා පවත්වා ගෙන යාමට ඉල්ලුම්කාර පළමුවන පාර්ශ්වකරුට නඩු නිමිත්තක් නොමැති බවත්, එහෙයින් පළමුවන පාර්ශ්වකරුගේ ඉල්ලුම්පත්‍රය නිෂ්ප්‍රභා කරන ලෙස ඉල්ලා ඇත. එකී කරුණු තුන පහත සඳහන් පරිදි වේ.

(1) පළමුවන පාර්ශ්වය හා දෙවන පාර්ශ්වය අතර සජීවී ආරාවුලක් නොමැති බව

(2) එස්ටොපල් න්‍යාය පළමු පාර්ශ්වයට එරෙහිව ක්‍රියාත්මක වන බව

(3) පළමුවන පාර්ශ්වකරු තම අයිතීන් මත නිදා සිටිම නිසා ඉල්ලීමක් කිරීමේ අයිතිය අහෝසි වී ඇති බව

ඒ එක් එක් කරුණ සම්බන්ධයෙන් නීතිඥ දිමුතු පනංගල මහත්මිය විසින් පහත සඳහන් පරිදි කරුණු දක්වා ඇත.

**4.1.1 පළමුවන පාර්ශ්වය හා දෙවන පාර්ශ්වය අතර සජීවී ආරාවුලක් නොමැති බව**

දෙවන පාර්ශ්වකාර, ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලය විසින් 2015 අංක 01 දරන මානව සම්පත් කළමනාකරණ කොට්ඨාස චක්‍රලේඛය නිකුත් කළ අතර, එකී චක්‍රලේඛය ප්‍රකාරව වයස අවුරුදු 57 සම්පූර්ණවීම මත විශ්‍රාම ගන්වන ලද සේවකයින්ට නැවත සේවය ඉල්ලා සිටීමෙන් අනතුරුව හිඟ වැටුප් රහිතව සේවයේ ප්‍රතිෂ්ඨාපනය සිදු කර අතර, එකී චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව දෙවන පාර්ශ්වය විසින්, පළමු පාර්ශ්වය මෙන්ම දිවයින පුරා සේවය කළ ලංගම සේවක සේවිකාවන් බොහෝ දෙනෙකු නැවත සේවයේ ප්‍රතිෂ්ඨාපනය කිරීම සිදුකර ඇත.

පළමුවන පාර්ශ්වය නැවත සේවයේ පිහිටුවීමෙන් පසු 2016.08.03 දින තෙක් සේවය කොට අවුරුදු 60 සම්පූර්ණවීම ප්‍රකාරව විශ්‍රාම යාමෙන් වසර 7 කට ආසන්න කාලයකට පසු පළමු පාර්ශ්වය විසින් සහන පතා මෙම බේරුම්කරණය වෙත පැමිණ ඇත. නමුත්, මෙම පැමිණිල්ලට අදාළ නඩු නිමිත්ත හටගනුයේ 2013 අංක 01 දරන රාජ්‍ය ව්‍යවසාය චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව පළමු පාර්ශ්වය වයස අවුරුදු 57 සම්පූර්ණවීමෙන් පසු 2013.08.03 දින විශ්‍රාම ගැන්වීම නිසාය.

කරුණු එසේ හෙයින්, මෙම යොමුව බේරුම්කරු වෙත යොමු වන විට පළමු පාර්ශ්වය හා දෙවන පාර්ශ්වය අතර සජීවී ආරවුලක් නොපවතින බව දෙවන පාර්ශ්වයේ ස්ථාවරය වේ.

පළමු පාර්ශ්වයහට 2013.08.03 දින අවුරුදු 57 සම්පූර්ණවීම ප්‍රකාරව සේවයෙන් විශ්‍රාම ගැන්වීම් පිළිබඳ කිසියම් ගැටලුවක් තිබුණි නම්, පළමු පාර්ශ්වය විසින් නැවත 2015 වර්ෂයේදී සේවය භාර ගැනීමට ප්‍රථම සහ ඊට අදාළ නියමයන් සහ කොන්දේසිවලට අත්සන් කිරීමට පෙර එය මතු කළ යුතුව තිබුණු බවද දෙවන පාර්ශ්වය ප්‍රකාශ කර ඇත.

හුදෙක් කරුණු මතු කිරීම පමණක් නොව, මෙවැනි ආරාවුලක් විමසීම් සඳහා ශුද්ධ විනිශ්චයක බලයක් හිමි බේරුම්කරුවෙකු වෙත කලාවරෝධී මාස 6 කාල සීමාව ඉකුත්වීමට පෙර පැමිණිල්ලක් ගොනු කිරීමට පළමු පාර්ශ්වය හට එවකට අවශ්‍ය කාලය හා හැකියාව තිබුණු බවද එහෙත් පළමු පාර්ශ්වකරු විසින් එය සිදු කර නැති බවද දෙවන පාර්ශ්වය ප්‍රකාශ කර ඇත.

පළමුවන පාර්ශ්වය 2016 දී විශ්‍රාම යාම නිසා, දෙවන පාර්ශ්වය හා පළමුවන පාර්ශ්වය අතර පැවති සේවා ගිවිසුම් අවසන් වී ඇති බැවින්, සේවකයකු රැකියාවක නියැලීම් නැවැත් වූ විට, පාර්ශ්වයන් අතර බලාත්මක සේවා ගිවිසුමක් නොමැති බැවින් සජීවී ආරාවුලක් ද නොමැති බව ඉහත දක්වා ඇති පැහැදිලි කිරීම් ප්‍රකාරව සනාථ වන බවත්, 1950 අංක 43 දරන කාර්මික ආරාවුල් පනත යටතේ ගරු ඇමතිවරයා විසින් කාර්මික අධිකරණයට සුළු කාර්මික ආරාවුල් (Minor Disputes) යොමු කිරීමේ මූලික අරමුණ වන්නේ කම්කරු අධිකරණය තුළ පවතින අනවශ්‍ය ප්‍රමාදය වළක්වා ගැනීමට වන අතර, පළමු පාර්ශ්වය උසාවියේ කාලාවරෝධි වූ ඉල්ලීමක් නැවත ලබාගැනීමට ගරු කාර්මික අධිකරණයේ ඇති විධිවිධාන භාවිතා කරන්නේ නම්, එය ව්‍යවස්ථාදායකයේ චේතනාව නැත්නම් අරමුණට (Intention of the Legislature) සහමුලින්ම පරස්පර එකක් වනු ඇති බවත්, පළමු පාර්ශ්වයේ ඉල්ලීමට ඉඩදීමෙන්, ගරු කාර්මිත අධිකරණය වෙත කාර්මික ආරාවුල් පනත මගින් "පවරා නොමැති" එහි මූලික හරයට පටහැනි අනවශ්‍ය වගකීමක් නිර්මාණය වන බවත්, එකී පනතේ චේතනාවට සහමුලින්ම පටහැනි වන බවත් දෙවන පාර්ශ්වයේ මතය වේ.

ඒ අනුව, දෙවන පාර්ශ්වය දන්වා ඇත්තේ, පළමු පාර්ශ්වය 2016 වර්ෂයේ විශ්‍රාම ගොස් ප්‍රධාන විශ්‍රාම ප්‍රතිලාභයක් වන පාරිතෝෂික මුදල ද, දෙවන පාර්ශ්වය වන ලංකා ගමනාගමන මණ්ඩලයෙන් ලබාදෙන ඉතා දීර්ඝ කාලයකට පසුව මෙසේ අධිකරණ බලයක් නොමැති බේරුම්කරණයේ සෙවන පතා පැමිණීමට උත්සාහ කිරීම කාර්මික පනතේ 17(2) හා 19 වගන්ති ප්‍රකාරව වලංගු නොවන බවය.

ඉහත සඳහන් කරුණු අනුව 1 වන පාර්ශ්වකරු ආර්.එම්. පියසේන මහතාගේ උපන් දිනය 1956.08.04 දින වන බවත්, ඔහු ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලයේ බදුල්ල ප්‍රාදේශීය කාර්යාලයට රැකවල් කරුවෙකු ලෙස 1983.08.01 දින සිට සේවය බැඳුණු බවත්, එතැන් පටන් විවිධ තනතුරු දරමින් අවසානයේ සහකාර (මුදල්) කළමනාකරුවෙකු (III B ශ්‍රේණිය) ලෙස සේවය කර, 2013.08.03. දිනට වයස 57 සම්පූර්ණවීම මත විශ්‍රාම ගැන්වූ බවත්, 2013.08.04 දින සිට 2013.12.31 දක්වා වැඩ බලන මුදල් සහකාර වරයෙකු ලෙස කොන්ත්‍රාත් පදනම මත සේවය කළ බවත්, ඉක්බිති 2014.01.01 දින සිට 2015.05.12 දින දක්වා කිසිදු තනතුරක සේවයේ නිරත නොවූ බවත්, යළිත් 2015.05.13 දින සිට වයස අවුරුදු 60 සම්පූර්ණ වන දිනය වූ 2016.08.03 දින දක්වා ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලයේ සේවයේ නිරතව සිටි බවත්, දෙපාර්ශ්වය විසින්ම පිළිගෙන තිබේ. ඒ අනුව පළමුවන පාර්ශ්වය හා දෙවන පාර්ශ්වය අතර සජීවී ආරාවුලක් නොමැති බවට දෙවන පාර්ශ්වය ඉදිරිපත් කරන තර්කය සනාථ වන්නේ නැත.

**4.1.2. එස්ටොපල් න්‍යාය පළමු පාර්ශ්වයට එරෙහිව ක්‍රියාත්මක වීම**

දෙවන පාර්ශ්වකාර, ශ්‍රී ලංගමය වෙනුවෙන් නීතිඥ දිමුතු පනංගල මහත්මිය විසින් ඉදිරිපත් කරන දෙවන විරෝධතාවය වන්නේ එස්ටොපල් (හෙවත් ප්‍රතිබන්ධනය) මූලධර්මය අනුව පුද්ගලයෙකුව කලින් යමක් කිරීමට අයිතියක් හෝ ඒ සඳහා පැහැදිලි අවස්ථාවක් ඇති විට ඒ සඳහා යම් ක්‍රියාවකට නැංවීමට නැඹුරු නොවීම හෝ යමක් ප්‍රකාශ කිරීමට ක්‍රියාමාර්ග නොගැනීමෙන් එම පුද්ගලයාට එරෙහිව එස්ටොපල් මූලධර්මය ක්‍රියාවට නැංවීමට අවස්ථාව සකසන හෙයින්, පළමුවන පාර්ශ්වයේ ක්‍රියාකාරිත්වය අනුව, පළමුවන පාර්ශ්වයට එරෙහිව එස්ටොපල් න්‍යාය ක්‍රියාත්මක වීම මත පළමුවන පාර්ශ්වයට බේරුම්කරණය සඳහා ඉල්ලීමක් කළ නොහැකි බවය.

පළමු පාර්ශ්වය 2013 අංක 01 දරන චක්‍රලේඛය ප්‍රකාරව අවුරුදු 57 සම්පූර්ණවීමෙන් විශ්‍රාම ගන්වා සිටිය ද, 2015 අංක 01 දරන චක්‍රලේඛය නිකුත් කිරීම මගින් 2013 අංක 01 දරන චක්‍රලේඛය ප්‍රකාරව විශ්‍රාම ගන්වන ලද සේවකයින් හට නැවත සේවය ඉල්ලා සිටිමට ඉඩ දීමෙන් අනතුරුව හිඟ වැටුප් රහිතව සේවයේ ප්‍රතිෂ්ඨාපනය සිදු කරන ලද, අතර, 2015 අංක 01 දරන චක්‍රලේඛනයේ විධිවිධාන ප්‍රකාරව පළමු පාර්ශ්වය මෙන්ම දිවයින පුරා සේවක සේවිකාවන් බොහෝ දෙනෙකු නැවත සේවයේ ප්‍රතිෂ්ඨාපනය කිරීම සිදුකර ඇත.

එස්ටොපල් න්‍යාය පිළිබඳ ක්‍රියාමක වීමේ පදනම එළඹෙන්නේ 2015/1 හා 2015.03.18 දාතම දරන චක්‍රලේඛය ක්‍රියාත්මක වීමක් සමගය. එහෙත් ආණ්ඩුවේ ප්‍රතිපත්තියට එකඟ වෙමින් පළමුවරට දෙවන පාර්ශ්වකරුගේ ආයතනයේ සේවයේ යෙදී සිටි සේවකයන්ට රාජ්‍ය ව්‍යවසාය අංක 01/2013 චක්‍රලේඛය අනුව 2013.01.01 දින සිට ක්‍රියාත්මක කිරීම සඳහා දෙවන පාර්ශ්වකරු තීරණය කළේ නම්, සහ එම චක්‍රලේඛයේ සඳහන් කර ඇති පරිදි, වයස අවුරුදු 57 ඉක්මවීම හේතු කොටගෙන විශ්‍රාම ගන්වන ලද. දිනයේ සිට නැවත සේවයේ යොදවන දිනය වන විට සේවයේ නොයෙදී සිටි සේවකයින් එකී කාලය තුළ වැටුප් රහිත කාලයක් මත තබන බවට තීරණයක් නොගන්නා ලද්දේ නම්, මෙම ආරාවුල ඇතිවීමට පදනම් වූ සියලුම කරුණු අහෝසි වීමට ඉඩ තිබිණ. එසේම අධ්‍යක්ෂ මණ්ඩලය අවස්ථා දෙකකදී තම

ආයතනයේ සේවකයින්ට හානිදායක වන ආකාරයේ තීරණයක් ගැනීමට පෙළඹුණේ ඇයිද යන්න කළමනාකාරිත්වය විසින් නිකුත් කර ඇති අංක 2013 අංක 1 හා 2013.10.14 දාතම දරන චක්‍රලේඛය මගින් හෝ චක්‍රලේඛ අංක 2015 අංක 1 හා 2015.03.18 දාතම දරන චක්‍රලේඛය මගින් හෝ දක්වා නැත.

එකී කරුණු අනුව පළමුවන පාර්ශ්වකරුගේ ආරාවුල සම්බන්ධයෙන් පළමු පාර්ශ්වයට එරෙහිව ස්ටොපල් න්‍යාය ක්‍රියාත්මක නොවන බව බේරුම්කරු විශ්වාස කරයි. ඒ අනුව දෙවන පාර්ශ්වයෙන් දෙවන කරුණ ද සනාථ වන්නේ නැත.

4.1.3. **පළමුවන පාර්ශ්වකරු ඔහුගේ අයිතීන් මත නිදා සිටීම (The First Party has slept on his right)**

දෙවන පාර්ශ්වකාර, ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලය වෙනුවෙන් නීතිඥ දිමුතු පනංගල මහත්මිය විසින් ඉදිරිපත් කරන තුන්වන විරෝධතාවය වන්නේ මෙම නඩුවෙහි නඩු නිමිත්ත පැන නැගී ඇත්තේ වර්ෂ 2013 දී වන අතර, ඉන් අනතුරුව සාධාරණ කාලසීමක් තුළ දී ගෞරවණීය ගරු බේරුම්කරණ අධිකරණයේ සහන පතා පැමිණීමට පළමු පාර්ශ්වය අපොහොසත් වී ඇති බැවින් පළමුවන පාර්ශ්වකරු ඔහුගේ අයිතීන් මත නිදා සිටීම යන රීතිය යටතේ සහනයක් ඉල්ලා බේරුම්කරණයට අයදුම් පතක් ඉදිරිපත් කළ නොහැකි බවත්, පළමු පාර්ශ්වකරු අවුරුදු 60 සම්පූර්ණවීම මත විශ්‍රාම ගන්වමින් දෙවන පාර්ශ්වකරුට යවන ලද 2016.06.15 දිනැති ලිපිය ප්‍රකාරව පළමු පාර්ශ්වකරුගේ වසර 33කට වැඩි සේවා කාලය ඇගයීමක් වශයෙන් අවසන් මස වේතනයට වේතන වර්ධක 03ක් එකතු කර ගෙවීම් කර ඇති බවත්, පළමුවන පාර්ශ්වය හා පවුලේ සාමාජිකයන් සඳහා වසරකට එක්වරක් බැගින් නිවාඩු ගමන් අවසර පත්‍රයක් සඳහා හිමිකම් ප්‍රදානයක් ද සිදු කර ඇති බවත්ය.

දෙවන පාර්ශ්වය වැඩිදුරටත් ප්‍රකාශ කර සිටින්නේ, අන් සේවකයින් මෙන් පළමු පාර්ශ්වය කිසිදු අවස්ථාවක දී 2013 විශ්‍රාම ගැන්වීම පිළිබඳව කම්කරු විනිශ්චය සභාවක නඩුවක් ගොනු කර නොමැති අතර, මේ වන විට නඩු නිමිත්ත කාලවරෝධී වී ඇති හෙයින්, එයට ප්‍රතිකර්මයක් ලෙස කරුණු වසන් කරමින් බේරුම්කරණය වෙත කරුණු ඉදිරිපත් කර ඇති බවත්ය.

දෙවන පාර්ශ්වකාර, ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලය වෙනුවෙන් ඉදිරිපත් කර ඇති ලිඛිත දේශනයේ දී නීතිඥ දිමුතු පනංගල මහත්මිය විසින් දීර්ඝ ලෙස කරුණු දක්වමින් සඳහන් කර ඇත්තේ පළමුවන පාර්ශ්වකරුගේ විශ්‍රාම ගන්වන ලද 2013.05.03 දිනය වන විට, විශ්‍රාම ගැන්වීමේ වයස සම්බන්ධව බලධාරී චක්‍රලේඛය වූයේ මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ අංක PED/60 දරන චක්‍රලේඛය බවත්, පළමුවන පාර්ශ්වකරුගේ විශ්‍රාම දිනය වන විට, අංක PED/1/2013 දරන චක්‍රලේඛය ක්‍රියාත්මකව නොපැවති බැවින්, චක්‍රලේඛනයේ විධිවිධාන පළමුවන පාර්ශ්වකරුට ඉල්ලා සිටිය නොහැකි බවත්ය.

දෙවන පාර්ශ්වය ඉදිරිපත් කර ඇති එම කරුණු අතාර්කික මෙන්ම යථාර්ථයෙන් තොර එකක් බව බේරුම්කරුගේ මතය වේ.

4.2 **මූලික විරෝධතාව පිළිබඳව බේරුම්කරුගේ තීරණය**

මූලික විරෝධතාව පිළිබඳව බේරුම්කරුගේ මතය වන්නේ, ආණ්ඩුවේ ප්‍රතිපත්තියට එකඟ වෙමින් පළමුවරට දෙවන පාර්ශ්වකරුගේ ආයතනයේ සේවයේ යෙදී සිටි සේවකයන්ට රාජ්‍ය ව්‍යාපාර 01/2013 චක්‍රලේඛය 2013.01.01 දින සිට ක්‍රියාත්මක කිරීම සඳහා තීරණය කළේ නම් සහ, එම චක්‍රලේඛයේ සඳහන් කර ඇති පරිදි, වයස අවුරුදු 57 ඉක්මවීම හේතු කොටගෙන විශ්‍රාම ගන්වන ලද සේවකයන් විශ්‍රාම ගත් දිනයේ සිට, නැවත සේවයේ යොදවන දිනය වන විට සේවයේ නොයෙදී සිටි දින දක්වා කාලය තුළ වැටුප් රහිත කාලයක් මත තබන බවට තීරණයක් නොගන්නා ලද්දේ නම්, මෙම ආරාවුල ඇතිවීමට පදනම් වූ සියලුම කරුණු අහෝසි වීමට ඉඩ තිබුණු බවය.

එසේම ඉහත සඳහන් කළ පරිදි අධ්‍යක්ෂ මණ්ඩලය අවස්ථා දෙකකදී ම ආණ්ඩුවේ ප්‍රතිපත්තිය ඉක්මවා යමින් තම ආයතනයේ සේවකයන්ගේ අයිතිවාසිකම්වලට හානිදායක වන ආකාරයේ තීරණයක් ගැනීමට අධ්‍යක්ෂ මණ්ඩලය පෙළඹුණේ ඇයි ද යන්න කළමනාකාරීත්වය විසින් නිකුත් කර ඇති අංක 2013 අංක 1 හා 2013.10.14 දාතම දරන චක්‍රලේඛය මගින් හෝ චක්‍රලේඛ අංක 2015 අංක 1 හා 2015.03.18 දාතම දරන චක්‍රලේඛ මගින් හෝ දක්වා නැති බව පෙන්වා දෙන අතර එනයින්ම දෙවන පාර්ශ්වය ඉදිරිපත් කර ඇති මූලික විරෝධතාවන් ප්‍රතික්ෂේප වන බව ද තීරණය කරමි.

5.0 පළමු පාර්ශ්වයේ ඉල්ලීම පිළිබඳව සලකා බැලීම

දෙවන පාර්ශ්වය ඉදිරිපත් කර ඇති විරෝධතාවයන් ඉහත සඳහන් පරිදි ප්‍රතික්ෂේප වී ඇති හෙයින් පළමුවන පාර්ශ්වකරු ඉල්ලා සිටින සහනයන් ලබා දිය හැකි ද යන්න පිළිබඳව විමසා බැලීමට තීරණය කරමි.

ඒ අනුව පළමුවන පාර්ශ්වකරු විසින් ඉල්ලා සිටින සහනය වන්නේ, 2014.01.01 දින සිට 2015.05.12 දින දක්වා කාලයට කොන්ත්‍රාත් කාලය ද ඇතුළත්ව, එනම්, 2013.08.04 - 2013.12.31 දක්වා කාලය ද ඇතුළත්ව හිඟ වැටුප් ලබදෙන ලෙසය.

පළමුවන පාර්ශ්වකරු විසින් ඉල්ලා සිටින එම සහනය සඳහා හිමිකමක් තිබේ ද යන්න විමසීමට භාජනය කිරීමේ දී සලකා බැලිය යුතු ප්‍රධාන කරුණු පහක් තිබේ. එනම්,

1. පළමුවන පාර්ශ්වකරු විධිමත්ව හා නීත්‍යානුකූලව වයස අවුරුදු 57 පිරීම හේතු කොටගෙන විශ්‍රාම යවා තිබුණේ ද?

2. වයස අවුරුදු 57 සම්පූර්ණ වන දිනය වනවිට පළමුවන පාර්ශ්වකරු වයස අවුරුදු 60 දක්වා සේවය කිරීම සඳහා නීතිමය හිමිකමක් ලබා තිබුණේ ද ?

3. එසේ දෙවන පාර්ශ්වකරු, දෙවන පාර්ශ්වකරුට එම හිමිකම ලබා දී නොතිබුණේ නම්, එයට යුක්ති සහගත සාධාරණ හේතුවක් තිබුණේ ද?

4. එම හිමිකම ලබා දුන්නේ නම්, ප්‍රශ්න ගත ආරාවුල උද්ගත නොවීමට හැකියාවක් තිබුණේ ද?

5. ඒ අනුව සහනයක් ලබාදීමට බේරුම්කරණය හැකියාවක් තිබෙනවා ද?

5.1 පළමුවන පාර්ශ්වකරු වයස අවුරුදු 57 පිරීම හේතු කොටගෙන විශ්‍රාම ගන්වා තිබුණේ විධිමත්ව හා නීත්‍යානුකූලව ද?

පළමුවන පාර්ශ්වකරු මුල් ඉල්ලීම සමග හෝ පළමුවන පිළිතුරු ප්‍රකාශය සමග හෝ, අවසාන ලිඛිත සැලකිරීම් සමග හෝ, ඔහු 2013.08.03 දින විශ්‍රාම ගැන්වූ බවට කරනු ලබන ප්‍රකාශය සනාථ කිරීම සඳහා අදාළ විශ්‍රාම ගැන්වීමේ ලිපිය බේරුම්කරණය වෙත සාක්ෂි ලේඛනයක් ලෙස ඉදිරිපත් කළේ නැත. දෙවන පාර්ශ්වය විසින් පළමුවන පාර්ශ්වකරු 2013.08.03 දිනට වයස 57 සම්පූර්ණවීම මත 2013.06.20 දාතම දරන ලිපිය මගින් විශ්‍රාම ගන්වා ඇති බව, දෙවන පාර්ශ්වයේ 2023.10.30 දිනැති ලිඛිත සැළකිරීම්වල (ගොනුවේ 156-166 පිටු) සඳහන් කර ඇති අතර ඒ බව සනාථ කිරීම සඳහා අදාළ විශ්‍රාම ගැන්වීමේ ලිපිය A46 වශයෙන් සඳහන් කරමින් ලිඛිත සැළකිරීම්වල ඇමුණුමක් ලෙස (167 පිටුව) බේරුම්කරණය වෙත ඉදිරිපත් කර ඇත. ඒ සම්බන්ධයෙන් පළමුවන පාර්ශ්වකරු විරෝධතාවක් දක්වා නැත. කෙසේ වෙතත් පළමුවන පාර්ශ්වකරු 2013.08.03 දින සිට විශ්‍රාම ගන්වා ඇත්තේ ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලයේ බදුල්ල ප්‍රධාන ප්‍රාදේශීය කළමනාකාරවරයා විසින් බව පෙනී යන අතර එම විශ්‍රාම ගැන්වීම විධිමත් ලෙස නියමිත බලධාරියා විසින්ම කරන ලද විශ්‍රාම ගැන්වීමක් ද යන්න බේරුම්කරණයේ දී අනාවරණය කර ගැනීමට නොහැකි විය.

5.2 වයස අවුරුදු 57 සම්පූර්ණ දිනය වනවිට පළමුවන පාර්ශ්වකරු වයස අවුරුදු 60 දක්වා සේවය කිරීම සඳහා නීතිමය හිමිකමක් ලබා තිබුණේ ද?

පළමුවන පාර්ශ්වකරු තම ඉල්ලීමෙහි හා පිළිතුරු ප්‍රකාශවල ද අවසාන ලිඛිත සැළකිරීම් වල ද දිගින් දිගටම ප්‍රකාශ කර සිටින්නේ, මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශයේ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද අංක 1/2013 හා 2013.01.15 දිනැති රාජ්‍ය ව්‍යවසාය චක්‍රලේඛය මගින්, රාජ්‍ය සංස්ථා ව්‍යවස්ථාපිත මණ්ඩලවල සේවකයන්, වයස අවුරුදු 60 සම්පූර්ණ වන තුරු සේවයේ යෙදවීමට දන්වා තිබුණු බවය.

පළමුවන පාර්ශ්වකරු ප්‍රකාශ කරනු ලබන පරිදි, ඔහු වසර 57 සම්පූර්ණ වීම හේතු කොටගෙන විශ්‍රාම ගන්වන දිනය එනම්, 2013.08.03 දින වන විට එකී PED 1/2013 දරන චක්‍රලේඛය 2013.01.01 දින සිට ක්‍රියාත්මක කිරීම සඳහා බලය දී තිබිණ.

එකී PED/1/2013 දරන චක්‍රලේඛයේ සඳහන් වන තවත් වැදගත් කරුණක් වන්නේ "අමාත්‍ය මණ්ඩලය විසින් ගනු ලැබූ තීරණයක් පරිදි අංක EA02BC/PB/01 හා 1992.04.20 දිනැති භාණ්ඩාගාර චක්‍රලේඛ ලිපිය හා උපාය මාර්ගික ව්‍යවසායයන් කළමනාකරණ ආයතනයේ (SEMA) 2004.12.17 දිනැති ලිපිය අනුව, භාණ්ඩාගාර චක්‍රලේඛ අනුගමනය කිරීමේ අවශ්‍යතාවයෙන් නිදහස් කර ඇති රාජ්‍ය ආයතන හා බැංකු සඳහා එකී චක්‍රලේඛයේ (PED අංක 1/2013) විධිවිධාන අදාළ නොවන බවට, සහ එම ආයතනවල සේවකයින්ගේ සේවා දීර්ඝ කිරීම සම්බන්ධව තීරණ අධ්‍යක්ෂ මණ්ඩලයේ අභිමතය පරිදි සිදුකළ යුතු බවට දක්වා ඇති විධිවිධානයන් ය.

තවද, සෙසු ආයතනවල සේවකයින්ට, සේවා දීර්ඝ කිරීමේ ඉල්ලීමක් නොමැතිව වයස වසර 55 සිට අනිවාර්ය විශ්‍රාම ගැන්වීමේ වයස වන වසර 60 දක්වා සේවය කළ හැකි බවත්, කාර්යක්ෂමතාවය හා කාර්ය සාධනය සතුටුදායක නොවන නිලධාරියෙකුට සේවා දීර්ඝයක් ලබා නොදීමට පත්වීම් බලධරයා විසින් තීරණය කරන්නේ නම්, එයට එරෙහිව අභියාචනා කිරීමට නිලධාරියාට අවස්ථාවක් සැලසෙන පරිදි, මාස 6ක පූර්ව දැනුම්දීමකින් පසුව විශ්‍රාම ගැන්වීමේ බලය පත්වීම් බලධරයා සතුවන බවත්, රාජ්‍ය ව්‍යවස්ථාවන්හි සේවකයින්ගේ විශ්‍රාම ගැන්වීමේ වයස සම්බන්ධයෙන් ඊට පෙර නිකුත් කර ඇති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක 60 අවලංගු කරන බවත්, යම් පැහැදිලි කර ගැනීමක් අවශ්‍ය නම්, රාජ්‍ය ව්‍යාසාය අධ්‍යක්ෂ ජනරාල් හෝ අතිරේක අධ්‍යක්ෂ ජනරාල් අමතා පැහැදිලි කරගන්නා ලෙසත්, (දුරකථන අංක ලබා දී ඇත) එකී අංක PED 1/2013 දරන චක්‍රලේඛය මගින් දන්වා ඇත.

ඒ අනුව 2013.01.01 දින සිටම රාජ්‍ය ව්‍යවසාය අංක 1/2023 චක්‍රලේඛය කිසිදු බාධාවකින් තොරව ක්‍රියාත්මක කිරීමට ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලය යටත් වනු ඇත.

එමෙන්ම එම යටත්වීමෙන් ඉවත්වීමට ඇති එකම අවස්ථාව වන්නේ ඉහත සඳහන් කළ පරිදි SEMA ආයතනයේ 2014.12.17 දිනැති ලිපිය අනුව සඳහන් කළ ආයතනයක් වීමය. එහෙත් ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලය SEMA ආයතනය විසින් නිකුත් කර ලද 2014.12.17 දිනැති ලිපිය අනුව එහි සඳහන් කළ ආයතනයක් නොවේ. එනිසා රාජ්‍ය ව්‍යවසාය අංක 1/2023 චක්‍රලේඛය ක්‍රියාත්මක නොකර සිටීමේ හැකියාවක් ශ්‍රී ලංගමයට නැත.

ඒ පිළිබඳව යම් ගැටලුවක් තිබුණි නම්, ශ්‍රී ලංගමයට, රාජ්‍ය ව්‍යවසාය පිළිබඳ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ හෝ අතිරේක අධ්‍යක්ෂ ජනරාල්ගේ දුරකථන අංකයට කථා කර හෝ ලිඛිතව විමසා හෝ උපදෙස් ලබා ගැනීමට හැකියාව තිබුණි. එහෙත් දෙවන පාර්ශ්වකරුවන්ගේ පිළිතුරු ප්‍රකාශවල හෝ ලිඛිත සැළකිරීම්වල හෝ එවැනි උත්සාහයක් ගත් බවට කිසිදු සඳහනක් දක්වා නැත.

එමෙන්ම එම චක්‍රලේඛය පළමුවන පාර්ශ්වකරුට පමණක් ක්‍රියාත්මක නොකර සිටීම සඳහා වූ ඔහුගේ අකාර්යක්ෂමතාව හෝ කාර්ය සාධනයට දායක වීම යන කරුණු මත නිදහසට කරුණු විමසීමක් හෝ විනය පරීක්ෂණයක් පැවැත්වූ බවක් හෝ ඒ පිළිබඳව සඳහන් කරමින් වයස අවුරුදු 60 සම්පූර්ණ වන තුරු සේවයේ යෙදවීමට අපේක්ෂා නොකරන ලද බව දන්වමින් පළමුවන පාර්ශ්වකරුට චක්‍රලේඛය III ඡේදයේ සඳහන් පරිදි මාස 6ක පූර්ව දැනුම්දීමේ ලිපියක් හෝ යවා නැත. ඒ අනුව පළමුවන පාර්ශ්වකරුට වයස අවුරුදු 60 සම්පූර්ණ දිනය දක්වා සේවය කිරීමේ නීත්‍යානුකූල අයිතියක් තිබූ බව මොනවට පැහැදිලි වේ.

**5.3 එසේ දෙවන පාර්ශ්වකරු, පළමුවන පාර්ශ්වකරුට එම හිමිකම ලබා දී නොතිබුණේ නම්, එයට යුක්ති සහගත සාධාරණ හේතුවක් තිබුණේ ද?**

ඉහත සඳහන් චක්‍රලේඛය පිළිබඳව අවධානය යොමු කරමින්, අධ්‍යක්ෂ මණ්ඩලය තීරණයක් ගෙන ඇත්තේ 2013.08.23 දිනය. එනම්, රාජ්‍ය ව්‍යාසාය අංක 1/2013 චක්‍රලේඛය නිකුත් කර මාස 8ක් ගතවීමෙන් පසුවය. එම තීරණය ගෙන ඇත්තේ ද 2013.09.01 දින සිට ක්‍රියාත්මක වන පරිදිය. අධ්‍යක්ෂ මණ්ඩලයේ එකී තීරණය අනුව ශ්‍රී ලංගමයේ මානව සම්පත් කොට්ඨාසය විසින් 2013 අංක 3 දරන අභ්‍යන්තර චක්‍රලේඛය නිකුත් කර ඇත්තේ 2013.10.14 දිනයේ දී ය.

එම චක්‍රලේඛය අනුව 1975.04.04 දිනට පෙර සේවයට බැඳුණු සේවකයින් සියලු දෙනාම විශ්‍රාම ගැන්වීමේ වයස අවුරුදු 60 වශයෙන් සැලකිය යුතු බවත්, 1975.04.04 දිනට පසු සේවයට බඳවා ගත් 2013.09.01 දින වන විට සේවයේ යෙදී සිටින සේවකයින් වෛකල්පික විශ්‍රාම යාමේ වයස අවුරුදු 55 බවත්, 55 සම්පූර්ණ වූ විට ඉල්ලීමකින් තොරව වයස 60 දක්වා සේවය කිරීමට හැකි බවත්, කාර්යක්ෂමතාව හා කාර්ය සාධනය අසතුටුදායක සේවකයන්ට අභියාචනා කිරීමට නිලධාරියාට අවස්ථාවක් සැලසෙන පරිදි, මාස 6ක පූර්ව දැනුම්දීමකින් පසුව අවුරුදු 55න් ඔබ්බට සේවය දීර්ඝ කිරීමක් ලබා නොදීමට පාලන අධිකාරියට බලය ඇති බවත් සඳහන් කර ඇත. තවද, කාර්ය සාධන වාර්තාවක් ලබා ගැනීම සඳහා වූ කොන්දේසියක් ද, වසර 57 දක්වා සේවය කරන සේවකයින්ට වසරින් වසර කාලය දීර්ඝ කිරීමට කොන්දේසියක් පනවා ඇත.

ශ්‍රී ලංගමයේ 2013 අංක 3 දරන අභ්‍යන්තර චක්‍රලේඛය නිකුත් කරන දිනය වන විට හා ඒ සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය තීරණයක් ගන්නා විට, පළමුවන පාර්ශ්වකරු වයස අවුරුදු 57 සම්පූර්ණ වීම මත බදුල්ල ප්‍රධාන ප්‍රාදේශීය කළමනාකාරවරයා විසින් 2013.06.20 දාතම දරන ලිපිය මගින් විශ්‍රාම ගන්වා තිබූ බව පෙනී යයි.

ඒ අතරතුර ශ්‍රී ලංගමයේ 2013 අංක 3 දරන අභ්‍යන්තර චක්‍රලේඛය අවලංගු කිරීමට 2015.03.18 දින තීරණය කර ඇති අතර, ඒ වෙනුවට 2015 අංක 1 චක්‍රලේඛය නිකුත් කර ඇත. ශ්‍රී ලංගමයේ 2015 අංක 1 දරන චක්‍රලේඛය පරිදි පළමුවන පාර්ශ්වකරු ද, 2013.08.03 දින සිට ක්‍රියාත්මක වන පරිදි යළි සේවයේ ප්‍රතිෂ්ඨාපනය කර ඇති අතර, 2013.03.04 දින සිට 2013.12.31 දින දක්වා කොන්ත්‍රාත් පදනම මත කරන ලද පත්වීම අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත නොකිරීම නිසා, එම කාලයට ස්ථිර පදනමින් වැටුප් නොගෙවීමට ද, 2015 අංක 01 චක්‍රලේඛයේ විධිවිධාන පරිදි විශ්‍රාම ගන්වන අවස්ථාවේ සිටි ශ්‍රේණියට අදාළ වැටුප් තලයේ පිහිටුවා එතැන් සිට වැටුප් වර්ධක ලබා දී, නියමිත වැටුප් පියවරේ තැබීමට ද කටයුතු කරන බව දන්වා ඇත.

එමෙන්ම එම අවසානයේ සඳහන් කර ඇත්තේ ලිපියේ සඳහන් කොන්දේසිවලට එකඟ වන්නේ නම්, සේවයට වාර්තා කළ හැකි බවයි. ඒ අනුව පළමුවන පාර්ශ්වකරු 2013.03.04 දින සිට සේවයට වාර්තා කර ඇති අතර, ඉක්බිති 2016.08.04 දිනට වයස අවුරුදු 60 සම්පූර්ණ වීම මත 2016.08.04 දින සිට සේවයෙන් විශ්‍රාම ගන්වන බව දන්වමින් 2016.06.15 ලිපිය යවා ඇති අතර එම ලිපිය A 59 වශයෙන් සළකුණු කරමින් ලිඛිත සැළකිරීම්වල ඇමුණුමක් ලෙස (ගොනුවේ 175 පිටුව) බේරුම්කරණය වෙත ඉදිරිපත් කර ඇත.

2015 අංක 1 චක්‍රලේඛයේ සඳහන් කර ඇති පරිදි 2011.04.29 දින නිකුත් කරන ලද රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තු අංක 60 අනුව වයස අවුරුදු 57 න් විශ්‍රාම ගිය සියලු දෙනාටම වසර 60 දක්වා සේවය කිරීමට හිමිකම් ලැබෙන්නේ සහ 2013 අංක 3 දරන අභ්‍යන්තර චක්‍රලේඛය වහාම ක්‍රියාත්මක වන පරිදි අවලංගු කරන බව සඳහන් වන හෙයින් පළමුවන පාර්ශ්වකරු වයස අවුරුදු 57 සම්පූර්ණ වීම මත විශ්‍රාම ගැන්වූ දිනයේ සිට වයස අවුරුදු 60 සම්පූර්ණ වන දිනය දක්වා සේවයේ යෙදීමට බාධාවක් නැති අතරම, ඒ බව නැවත සේවය ප්‍රතිෂ්ඨාපනය කර ඇති ලිපියේ ද නිශ්චිතව හා පැහැදිලිව සඳහන් කර ඇත. ඒ අනුව ඔහු කොන්ත්‍රාත් පදනම මත සේවය කළ කාලයට ද එම කාලයට ඔහුට ගෙවන ලද වැටුප අඩු කර ගෙන ස්ථිර සේවයට අදාළ වැටුප් ගෙවීමට බාධාවක් නොතිබූ බව නිරීක්ෂණය කරමි.

5.4 **එම හිමිකම ලබා දුන්නේ නම්, ප්‍රශ්න ගත ආරවුල උද්ගත නොවීමට හැකියාවක් තිබුණේ ද?**

ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලයේ 2015 අංක 1 දරන චක්‍රලේඛය පරිදි පළමුවන පාර්ශ්වකරු, යළි සේවයේ ප්‍රතිෂ්ඨාපනය කරමින් නිකුත් කරන ලද ලිපියේ සඳහන් වන පරිදි 2013.03.04 දින සිට 2013.12.31 දින දක්වා කාලය තුළ සේවය කරමින් සිටියදීත්, එම කාලයට හිඟ වැටුප් නොගෙවන බවට සඳහන් කර ඇති කොන්දේසිය යුක්ති සහගත සාධාරණ නොවන බව නිරීක්ෂණය කරමි. එවැනි කොන්දේසියක් ඇතුළත් නොකොට, අංක 2015 අංක 1 දරන චක්‍රලේඛයේ 2.01 වගන්තිය පරිදි ක්‍රියා කළේය නම්, සැබවින්ම පළමුවන පාර්ශ්වකරුට ඔහු තම ඉල්ලීමෙහි සඳහන් කර ඇති පරිදි 2014.01.01 දින සිට 2015.05.12 දින දක්වා (කොන්ත්‍රාත් කාලය ද ඇතුලුව) කාලයට හිඟ වැටුපක් ඉල්ලා සිටීමට අවස්ථාවක් නොලැබෙනු ඇත. එමෙන්ම පළමුවන පාර්ශ්වකරු 2014.01.01 දින සිට 2015.05.12 දින දක්වා සේවයේ නොයෙදුනේ ඔහුගේ වරදක් නිසා නොව, රාජ්‍ය ව්‍යවසාය අංක 1/2013 දරන චක්‍රලේඛයේ විධිවිධාන උල්ලංඝනය කරමින් ශ්‍රී ලංගමය ක්‍රියා කිරීම නිසාය. එහෙයින් එම කාලයට ද ඔහුට හිඟ වැටුප් ලැබීමට හිමිකමක් ඇති බව නිරීක්ෂණය කරමි.

5.5 **ඉල්ලුම්කරුට සහනයක් ලබාදීමට හැකියාවක් තිබෙනවා ද ?**

ඉහත සඳහන් පරිදි ශ්‍රී ලංගමය නීති විරෝධී ලෙස හා සාවද්‍ය ලෙස ක්‍රියාකරමින්, රාජ්‍ය ව්‍යවසාය අංක 1/2013 දරන චක්‍රලේඛයේ විධිවිධාන නියමිත දින සිට ක්‍රියාත්මක නොකිරීම නිසා ප්‍රශ්නගත ආරාවුල උද්ගත වී ඇති බව නිරීක්ෂණය වන අතර, ඒ නිසාම පළමුවන පාර්ශ්වකරුට ආරාවුලකට මුහුණදීමට සිදු වූ බව ද නිරීක්ෂණය වේ.

පළමුවන පාර්ශ්වකරු ආරාවුලට මුහුණ දෙන්නේ, ඔහු වසර 57 සම්පූර්ණ වූ දිනයේ සිට අයුක්ති සහගත හා සාවද්‍ය ලෙස විශ්‍රාම ගැන්වීමෙන් පසුව සහ එම වරද නිවැරදි නොකරමින් දෙවන පාර්ශ්වකරු විසින් 2015.05.08 දාතම දරන ලිපිය මගින් පළමුවන පාර්ශ්වකරු 2013.08.03 දින සිට යළි සේවයේ ප්‍රතිෂ්ඨාපනය කර 2016.08.03 දින දක්වා සේවය කරමින් සිටියදීය. ඒ අනුව පාර්ශ්වකරුවන් අතර ඇති වී තිබෙන ආරාවුල ආරම්භ වන්නේ පළමුවන පාර්ශ්වකරු නියමිත පරිදි හා විධිමත් පරිදි විශ්‍රාම ගැන්වූ 2016.08.03 දිනට පෙර සහ අවිධිමත් ලෙස විශ්‍රාම ගැන්වූ 2013.08.03 දිනට පසු කාල වකවානුව තුළදීය.

එහෙයින් 2 වන පාර්ශ්වකරුවන් විසින් තම අවසාන ලිඛිත සැළකිරීම් සමග ඉදිරිපත් කර ඇති SC Appeal No. 22 / 2012 (Mer Ca Investments Ltd Vs. J. A. Sumith and) හමුවේ සහ The State Bank of India, Vs Sundaralingam යන නඩුවේ අන්තර්ගත කරුණු හා තීන්දු ප්‍රස්තුත සිද්ධියට අදාළ නොවන බව ගෞරව පූර්වකව පෙන්වා දෙන අතරම, පළමුවන පාර්ශ්වකරුට සහනයක් ලබාගැනීම සඳහා යුක්තිසහගත සාධාරණ නඩු නිමිත්තක් උපචය වී ඇති බවත්, ඒ නිසා ඔහුට 2014.01.01 දින සිට 2015.05.12 දක්වා කාලය (කොන්ත්‍රාත් කාලය ඇතුළුව) හිඟ වැටුප් ඉල්ලීම සඳහා හිමිකමක් උපචය වී ඇති බවත් නිරීක්ෂණය කරමි.

එසේම දෙවන පාර්ශ්වය විසින් සඳහන් කරනු ලබන පරිදි, පළමුවන පාර්ශ්වකරුව යළි සේවයේ ප්‍රතිෂ්ඨාපනය කිරීමේදී, ඔහුට යවන ලද ලිපියේ සඳහන් කොන්දේසි පිළිගැනීමට එකඟව අත්සන් තබා ඇති බවත්, තමාට සිදුවී ඇති හානිය එනම් හිඟ වැටුප් නොඉල්ලීමට ප්‍රතිබන්ධනය වී ඇති බවටත් කරනු ලබන ප්‍රකාශයන් සමග එකඟ විය නොහැකි බව නිරීක්ෂණය කරමි.

මන්දයත්,

(අ) ප්‍රතිබන්ධනගත වී ඇති විෂය වස්තුවේ එක් කොටසක්, එනම්, 2013.08.04 දින සිට 2013.12.31 දින දක්වා කාලය තුළ පළමුවන පාර්ශ්වකරු ආයතනයේ සේවය කරන්නේ සේවය කිරීමට ඔහුට පත්වීමක් ලබා දී තිබීම නිසාය. එබැවින් එම පත්වීම අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත නොකිරීම නිසා ඔහු කරන ලද සේවය ගණන් නොගෙන සිටීමට හැකියාවක් නැත. එහෙයින් එම කාලය තුළ පළමුවන පාර්ශ්වකරු කොන්ත්‍රාත් පදනම මත සේවය කර ඇති හෙයින්, එම කාලය ඔහුට හිඟ වැටුප් හිමිවිය යුතුය.

(ආ) විෂය වස්තුවේ දෙවන කොටස වන්නේ, පළමුවන පාර්ශ්වකරු 2014.01.01 දින සිටය. 2015.05.12 දින දක්වා වූ කාලය තුළ ස්ථිර සේවයේ නොයෙදෙන්නේ ඔහුගේ වුවමනාව මත නොව, දෙවන පාර්ශ්වකරු ගත් සාවද්‍ය තීරණයක් හේතු කොටගෙනය.

(ඇ) එසේම පළමුවන පාර්ශ්වකරු යළි සේවයේ ප්‍රතිෂ්ඨාපනය කරමින් යවන ලද ලිපිය අනුව 2013.08.04 දින සිට, ඔහු ඒ වන විට දැරූ සේවා තත්ත්වය හා වැටුප් පරිමාණයේ වැටුප් තලය පදනම් කරගෙන වැටුප් ගෙවන බවට සඳහන් වීමෙන් තහවුරු වන්නේ එම මුළු කාලයම පළමුවන පාර්ශ්වකරු සේවයේ යෙදී සිටියාසේ සළකා දෙවන පාර්ශ්වකරු කටයුතු කර ඇති බවය. ඒ අනුව පළමුවන පාර්ශ්වකරුට අදාළ වැටුප් හා දීමනා (ව්‍යවස්ථාපිත දීමනා) ලැබීමට හිමිකමක් ඇත.

එහෙයින්,

1. මෙම ප්‍රදානය *ගැසට් පත්‍රයේ* පළකිරීමෙන් පසු මසක් ඇතුළත පළමුවන පාර්ශ්වකාර පැමිණිලිකරු ඉල්ලා සිටින සහනය වන, 2014.01.01 දින සිට 2015.05.12 දින දක්වා කාලය සඳහා හිඟ වැටුප වන (මසකට රු. 6880.00 බැගින් මාස දහසයක් සඳහා වන රු. 110,080.00 ගෙවන ලෙසටත්

2. එම හිඟ වැටුප ගෙවන බව තහවුරු කරනු වස් ඒ හා සමාන මුදලක් ලෙස සැළකිය හැකි එකී හිඟ මුදල වන රු. 110,080.00 සහ ඒ සඳහා වන නෛතික පොලිය වශයෙන් 2015.05.12 දින සිට ගණනය කළ යුතු සියයට 12 ක පොලී මුදල මෙම ප්‍රදානය *ගැසට් පත්‍රයේ* පළකිරීමෙන් පසු මාසයක් ඇතුළත නැගෙනහිර කොළඹ සහකාර කම්කරු කොමසාරිස් වෙත තැන්පත් කළ යුතු ලෙසටත් දෙවන පාර්ශ්වයට නියම කරමි.

3. මෙම ප්‍රදානය සාධාරණ හා යුක්ති සහගත ප්‍රදානයක් බව තීරණය කරමි.

ආචාර්ය **ඒ. එච්. ගමගේ,**
බේරුම්කරු.

2024 මාර්තු මස 20 වැනි දින දී ය.

EOG 08 – 0327

මගේ අංකය: IR/COM/04/2023/20.

**කාර්මික ආරාවුල් පනත 131 වන අධිකාරය**

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2023.11.23 දිනැති හා අංක 2359/34 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2023.11.15 දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් ඌව පැල්වත්ත, පස්සර පාර හි පදිංචි වයි. වී. ඒ. සුදත් වසන්ත මයා සහ බුත්තල, පුද්ගලික තැපැල් මල්ල, පැල්වත්ත ඒකකය හි පිහිටි සී/ස ලංකා සීනි (පුද්ගලික) සමාගම අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත්කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති අංක A/75/2023 හා 2024.07.04 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

**එච්. කේ. කේ. ඒ. ජයසුන්දර,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2024 අගෝස්තු මස 13 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

**බේරුම්කරණ අංශය හා කාර්මික අධිකරණයේ දී ය**

*ගොනු අංකය:* අයිආර්/කොම්/04/2023/20.
*බේරුම්කරණ නඩු අංකය:* ඒ/75/2023

වයි. වී. ඒ. සුදත් වසන්ත මයා,
පස්සර පාර,
ඌව පැල්වත්ත.

*පළමු පාර්ශ්වය*

සී. ස. ලංකා සීනි (පුද්ගලික) සමාගම,
පැල්වත්ත ඒකකය,
පුද්ගලික තැපැල් මල්ල,
බුත්තල.

*දෙවන පාර්ශ්වය*

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර පවතින ආරාවුල සම්බන්ධයෙන් ගරු කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය ගරු මනූෂ නානායක්කාර මැතිතුමා විසින් 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධන මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තිය ප්‍රකාරව තමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර එම ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් බත්තරමුල්ල, පැලවත්ත, සිංහපුර පාරේ අංක 117 හි පදිංචි සිරි සිංගප්පුලි වන මා පත්කොට ඇත.

**බේරුම් කළයුතු කරුණු**

කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ අංක අයිආර්/කොම්/04/2023/20 සහ 2023.10.20 දාතම සහිත යොමුවෙන් දක්වා ඇති පරිදි බේරුම් කළ යුතු කරුණු වනුයේ සී/ස ලංකා සීනි (පුද්ගලික) සමාගමේ සේවය කරන වයි. වී. සුදත් වසන්ත මයාට ජ්‍යෙෂ්ඨ ක්ෂේත්‍ර සහකාර එස් 1 තනතුර හිමි ද හිමිනම් එය ලබා නොදීමෙන් ඔහුට අසාධාරණයක් සිදුව තිබේ ද යන්නත් එසේ අසාධාරණයක් සිදුව තිබේ නම් ඔහුට හිමි විය යුතු සහන මොනවාද කවරදා සිට ද යන්නත් පිළිබඳව වේ.

**පාර්ශ්වයන් වෙනුවෙන් පෙනීසිටීම**

අදාළ බේරුම්කරණ ක්‍රියාවලියේ දී ඉල්ලුම්කාර පළමුවන පාර්ශ්වය වෙනුවෙන් රැකවරණ නිලධාරී එම්. කේ. හේමපාල යන අය ද දෙවන පාර්ශ්වය වෙනුවෙන් සී/ස ලංකා සීනි (පුද්ගලික) සමාගමේ නීති නිලධාරිනි නිරෝශා වික්‍රමසිංහ යන අය ද පෙනී සිටින ලදී.

**ආරාවුලේ පසුබිම**

පළමු පාර්ශ්වය 2006.09.01 දින සිට ලංකා සීනි (පුද්ගලික) සමාගමේ ස්ථිර සේවයට පත්ව ඇති 2014.10.09 දින සිට ක්ෂේත්‍ර සහකාර එස් 2 ශ්‍රේණියට උසස් කර ඇත. පළමු පාර්ශ්වය සිදු කළා යැයි දක්වන අක්‍රමිකතාවයක් නිසා ඔහු බුත්තල ක්ෂේත්‍ර කාර්යාලයේ සිට ප්‍රධාන කාර්යාලයට ස්ථාන මාරු කර රාජකාරි පැවරීමකින් තොර වරදවා තබාගෙන ඇත. ඉහත සඳහන් අක්‍රමිකතාවයට අදාළ දිරි දීමනා මුදල අදාළ ගොවි මහතා ආපසු ගෙවීමට එකඟ වීම නිසා ඉල්ලුම්කරුට අවවාද කොට වන්දම කොට්ඨාස කාර්යාලයට මාරු කර යවන බව දන්වා ඇත.

මේ ආකාරයට විසඳුමකට එළැඹ සිටිය දී දෙවන පාර්ශ්වයේ වැඩ බලන සාමාන්‍යාධිකාරීවරයා 2020.05.04 දාතමින් චෝදනා පත්‍රයක් නිකුත්කොට ඉල්ලුම්කරුට එරෙහිව විනය පරීක්ෂණයක් පවත්වා ඇත. මෙම පරීක්ෂණය පැවති අතරවාරයේ 2020.11.21 දින ජ්‍යෙෂ්ඨ ක්ෂේත්‍ර සහකාර එස් 1 ශ්‍රේණියට උසස්වීම සඳහා පැවති සම්මුඛ පරීක්ෂණයේ දී ලකුණු 66ක් ලබා එකී උසස්වීමට සුදුසුකම් ලබා ඇතිමුත් සටහන් තීරුවේ ''පෙන්ඩින් ඩොමැස්ටික් ඉනක්වයරි'' යනුවෙන් සඳහන්ව ඇති බව හෙළිදරව් කරගෙන ඇත.

මෙම උසස්වීම ලබාදෙන ලෙස වාචිකව සහ ලිඛිතව ඉල්ලා සිටිය ද එය ඉටු නොවීම නිසා කම්කරු දෙපාර්තමේන්තුවට පළමු පාර්ශ්වය පැමිණිලි කර ඇති අතර සම්මුඛ පරීක්ෂණ දින සිට තමාට ජ්‍යෙෂ්ඨ ක්ෂේත්‍ර සහකාර එස් 1 ශ්‍රේණියේ තනතුර හිඟ වැටුප් සහිතව ලබාදෙන ලෙස ද පදනම් විරහිත ලෙස නඩු හබවලට පැටලී විශාල වියදමක් දරන්නට සිදුව ඇති හෙයින් එම මුදල ලබාදෙන ලෙස ද ඉල්ලා ඇත.

දෙවන පාර්ශ්වය පවසන්නේ පළමු පාර්ශ්වයට එරෙහිව විනය පරීක්ෂණයක් පැවැත්වෙමින් තිබූ බවත් එහිදී ඉදිරිපත් කරන ලද චෝදනා හතරෙන් තුනකට වරදකරු වී ඇති බවත් මොහු එම පරීක්ෂණයෙන් නිදොස්කොට නිදහස්කර නොමැති බවත් එහෙයින් ආයතනයේ පවතින සාමාන්‍ය ක්‍රමවේදය අනුව එම අවස්ථාවේ උසස්වීම ලබාදීම අත්හිටුවා ඇති බවත් මෙම සේවකයාට අසාධාරණයක් සිදුකර නැති බවත්ය.

**බේරුම්කරණ නඩු විභාගය**

මෙම බේරුම්කරණ නඩු විභාගය පවත්වාගෙන යන අතරතුර 2024.03.25 දින ඉතා වැදගත් ප්‍රකාශයක් දෙවන පාර්ශ්වය වෙනුවෙන් පෙනීසිටි නීති නිලධාරිණිය සිදුකරන ලදී. ඇය ඉල්ලා සිටියේ තම ආයතනයට අලුතෙන් පත්ව සිටින ප්‍රධාන විධායක නිලධාරීවරයා වෙත පළමු පාර්ශ්වය ඉදිරිපත් කර ඇති අභියාචනයකට අනුව මෙම කාරණයට අදාළ පූර්ණ වාර්තාවක් ලබාදෙන ලෙස තමාගෙන් ඉල්ලා ඇති බවත් එතුමා සමග සාකච්ඡා කර මෙම නඩුවට අදාළ සමථ යෝජනාවක් ඇද්ද නැද්ද යන්න ගැන ඉදිරි නඩු දිනයේ වාර්තා කිරීමට අවස්ථාව ලබාදෙන ලෙසය.

මෙම ඉල්ලීම සලකා බැලූ බේරුම්කරණ අධිකරණය ඊට අවස්ථාව සළසා දෙමින් ඉදිරි දිනයකට නඩුව කල් තබන ලදී. ඒ අනුව 2024.04.26 පැවති විභාගයට සමථ යෝජනාවක් දෙවන පාර්ශ්වය විසින් ඉදිරිපත් කළේය. පළමු පාර්ශ්වය ද මූලික වශයෙන් එම යෝජනාව පිළිගැනීමට ඇති එකඟතාවය විනිශ්චය සභාව හමුවේ පළකරන ලදී. ඒ අනුව නඩුව ඉදිරියට පවත්වාගෙන යාමට අවශ්‍ය වූයේ නැත.

## ප්‍රදානය

කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ අංක අයිආර්/කොම්/04/2023/20 සහ 2023 ඔක්තෝබර් 20 දිනැති යොමුවෙන් සිදුකර ඇති විමසුම නිරීක්ෂණය කරමින් සී/ස ලංකා සීනි (පුද්ගලික) සමාගමේ සේවය කරන වයි. වී. ඒ. සුදත් වසන්ත යන අයට ජ්‍යෙෂ්ඨ ක්ෂේත්‍ර සහකාර එස් 1 තනතුර ලබා නොදීමෙන් ඔහුට අසාධාරණයක් සිදුව ඇති බව තීරණය කරන අතර එම ගැටළුවට විසඳුමක් යෝජනා කරමින් සී/ස ලංකා සීනි (පුද්ගලික) සමාගම ලබා දී ඇති සමථ යෝජනාව පිළිගැනීමට තීරණය කරමි. ඒ අනුව ජ්‍යෙෂ්ඨ ක්ෂේත්‍ර සහකාර එස් 1 තනතුර ලබාදීමට අදාළව 2020.11.21 දින පවත්වා ඇති සම්මුඛ පරීක්ෂණය සැලකිල්ලට ගෙන සී/ස ලංකා සීනි (පුද්ගලික) සමාගමේ අනෙකුත් සේවකයින්ට ජ්‍යෙෂ්ඨ ක්ෂේත්‍ර සහකාර එස් 1 ශ්‍රේණිය ලබා දී ඇති ආකාරයට 2021.01.01 සිට පෙරදාතම් කර පළමු පාර්ශ්වකරුට එකී ශ්‍රේණිය ලබාදිය යුතු බවටත් එකී කාල සීමාව තුළ ඔහුට අහිමි වී ඇති යම් දීමනාදිය වෙයි නම් සී/ස ලංකා සීනි (පුද්ගලික) සමාගම එකී දීමනාවන් ලබාදිය යුතු බවටත් නියම කරමි. ඒ අනුව මෙම ප්‍රදානය *ගැසට් පත්‍රයේ* පළවී මසක් ඇතුළත ක්‍රියාත්මක කොට ඒ බව මොනරාගල දිස්ත්‍රික් කම්කරු කාර්යාලයේ සහකාර කම්කරු කොමසාරිස් වෙත වාර්තා කළ යුතුය.

මෙය සාධාරණ හා යුක්ති සහගත ප්‍රදානයක් බව තවදුරටත් ප්‍රකාශ කරමි.

**සිරි සිංගප්පුලි (එල්. එල්. බී.)**
බේරුම්කරු.

2024 ජුලි මස 04 දින දී ය.

EOG 08 - 0328

---

මගේ අංකය: IR/COM/03/2020/243.

## කාර්මික ආරාවුල් පනත – 131 වන අධිකාරය

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2024.04.25 දිනැති හා අංක 2381/31 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2024.04.17 දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් රත්නපුර, ශ්‍රී පාද මාවත, 1 වන පටුමග, අංක 21/2 හි පදිංචි ඒ. කේ. අශෝක රංජිත් මහතා හා කොළඹ 06, කිරුළපන ඇවනිව්, අංක 54හි පිහිටි ලලාන් රබර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත්කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති 2024.05.31 දිනැති A/16/2024 ප්‍රදානය කරනු ලැබූ 2024.07.08 දිනැති හා අංක 2392/15 දරන *ගැසට් නිවේදනයේ* දෝෂ නිවැරදි කිරීම සඳහා 2024.08.02 දිනැති සංශෝධිත ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

**එච්. කේ. කේ. ඒ. ජයසුන්දර,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2024 අගෝස්තු මස 13 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

2024 ජූලි මස 08 දින 2392/15 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද ප්‍රදානය සංශෝධනය කිරීම

**බේරුම්කරණ අංශය හා කාර්මික අධිකරණය.**

ඒ. කේ. අශෝක රංජිත් මහතා,
අංක 21/2, 1 වන පටුමග,
ශ්‍රී පාද මාවත, රත්නපුර.

*පළමු පාර්ශ්වය*

ලලාන් රබර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
අංක 54, කිරුළපන ඇවිනිව්,
කොළඹ 06

*දෙවන පාර්ශ්වය*

අතර පවතින ආරවුල
යොමු අංකය: 1R /Com/03/2020/243
නඩු අංකය: A /16/2024

**ප්‍රදාන පත්‍රය සංශෝධනය කිරීම**

2024 ජූලි මස 08 වන දින ප්‍රසිද්ධ කරන ලද අංක 2392/15 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* 3A පිටුවේ ප්‍රදානයේ 03, 04, 05, 06, යන ඡේදයන් පහත පරිදි සංශෝධනය විය යුතුය.

2024.05.21 වන දින මෙම නඩුව කැඳවූ අවස්ථාවේ පළමු පාර්ශ්වය වෙනුවෙන් 2024.05.17 දින ලිපියක් ඉදිරිපත් කරමින් අධිකරණය වෙත දැනුම් දී සිටියේ ඒ. කේ. අශෝක් රංජිත් මහතා පිළිකා රෝගී තත්වයෙන් පෙළෙන නිසා බදුල්ල මහ රෝහලේ ප්‍රතිකාර ලබන හෙයින් සානුකම්පිත දීමනාවක් මෙන්ම පූර්ණ හා අවසාන සමථයක් වශයෙන් රු, 100,000.00 මුදලක් (රුපියල් ලක්ෂයක) ගෙවීමක් කරන ලෙසට පළමු පාර්ශ්වයේ ඉහත ලිපියෙන් ලලාන් රබර් (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනයේ ප්‍රධාන විධායක නිලධාරී වෙත ඉල්ලීමක් කර ඇති බව සඳහන් කරන ලදී. මේ සම්බන්ධයෙන් දෙවන පාර්ශ්වය කියා සිටියේ සානුකම්පිත දීමනාවක් වශයෙන් හා පූර්ණ හා අවසාන සමථයක් වශයෙන් එම මුදල සෘජුවම ඉල්ලුම්කරු වෙත ගෙවීමට හැකි බවයි. තව ද ඇය කියා සිටියේ මෙය පූර්වාදර්ශයක් නොවිය යුතු බවය.

ඉහත ඉදිරිපත් කළ කරුණු දෙපාර්ශ්වයම පිළිගත් නිසා මේ පිළිබඳ *ගැසට්* නිවේදනය ලංකා ආණ්ඩුවේ *ගැසට්* පත්‍රයේ පළවී දින 14ක් ඇතුළත එම මුදල බටහිර කොළඹ සහකාර කම්කරු කොමසාරිස් වෙත තැන්පත් කළ හැකි බව පෙන්වා දෙන ලදී. ඒ අනුව මෙම බේරුම්කරණය සමථයකට පත්වූ බව සඳහන් කරන අතර එය පූර්වාදර්ශයක් නොවිය යුතු බවට ද නිගමනය කරමි.

**ප්‍රදානය**

මෙම නඩුවේ ඉල්ලුම්කරු වන ඒ. කේ. අශෝක් රංජිත් මහතාට දෙවන පාර්ශ්වය විසින් සානුකම්පිත දීමනාවක් වශයෙන් හා පූර්ණ හා අවසාන සමථයක් වශයෙන් රු. 100,000,00 (රුපියල් ලක්ෂයක) මුදලක් ගෙවීමට එකඟතාවය පළ කල බැවින් එයට ඉඩ දෙමින් අදාළ මුදල ලලාන් රබර්ස් ප්‍රයිවට් ලිමිටඩ් ආයතනය විසින් මෙම *ගැසට්* නිවේදනය ලංකා ආණ්ඩුවේ *ගැසට්* පත්‍රයේ පළවීමෙන් දින 14 කට පසු එම මුදල බටහිර කොළඹ සහකාර කම්කරු කොමසාරිස් වෙත තැන්පත් කළ යුතු බවට මෙයින් නියෝග කර නියම කරමි. මේ අනුව මෙම බේරුම් කරණය සමථයකට පත් වූ බව සඳහන් කරමි. මෙය සාධාරණ සහ යුක්ති සහගත ප්‍රදානයක් බව තීරණය කරමි.

**බී. කේ. හේරත්,**
බේරුම්කරු

2024 අගෝස්තු මස 02 වැනි දින,
බේරුම්කරණ අංශය හා කාර්මික අධිකරණ ශාඛාවේදීය.

EOG 08 - 0329

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.